# <u>මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ</u>
# <u>අධීක්ෂණ කළමණාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි රසායනාගාර ශිල්පී</u>
# <u>තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය</u>

**01. සම්බන්ධ වන ආයතන.**

1.1 දෙපාර්තමේන්තුව : මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව
යොමු අංකය : CPC/CS/11/1/1/52(I) දිනය : 2016-02-09

1.2 අමාත්‍යාංශය : මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යාංශය
යොමු අංකය : CPC/CMS/1/16/17-III දිනය : 2016-02-17

1.3. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම
යොමු අංකය : DMS/D/පොදු/11-2 දිනය : 2012.12.19

1.4 ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය
යොමු අංකය : CPC/CS/2/3/SM/C/(V) දිනය : 2016-03-02

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය
යොමු අංකය : NCP/10/71/2/SR. දිනය : 2016.08.16

1.6 මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශ
යොමු අංකය : CPC/PSC/29/3/1(II) දිනය : 2016.10.25

**02 පත් කිරීම් බලධාරියා** : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

**03. සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 සේවා ගණය : අධීක්ෂණ කළමණාකරණ සහකාර - තාක්ෂණික

3.2 ශ්‍රේණි : III,II, හා I ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්යය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

මධ්‍යම පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් ක්‍රියාත්මක කරනු ලබන (ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති) සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ මධ්‍යම හා විශාල පරිමාණ ව්‍යාපෘතින්හි මූලික සමීක්ෂණ සඳහා අවශ්‍ය දත්ත සම්පාදනය කිරීම, එම ක්ෂේත්‍රයේ ඉංජිනේරුමය ද්‍රව්‍ය සඳහා තත්ත්ව පරීක්ෂණ කටයුතු වල (පස්, යකඩ,වැලි,ගල් හා කොන්ක්‍රීට් ද්‍රව්‍යයන්හි හා අනෙකුත් ඉදිකිරීම් ද්‍රව්‍ය වල ගතිගුණ හා ශක්තීන් පිළිබද) නිරතවීම හා එම ද්‍රව්‍යයන්හි ප්‍රමිතීන් නිර්ණය කිරීමට අවශ්‍ය පරීක්ෂණ ඉටු කිරීමට ඉංජිනේරු වෙත සහාය වීම.

එලෙසම රජයේ හා පෞද්ගලික ආයතන වලින් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව වෙත ලැබෙන ඉල්ලීම අනුව ඉහත පරිදි පරීක්ෂණ කටයුතු වල නිරත වීම හා ඉංජිනේරු වෙත සහාය වීම.

**3.4 කාර්යයන් පැවරීම** :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත යෝග්‍යතාව හා කුසලතාව මත පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධාරියෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැකිය.

අනුමත කරමි / ~~නොකරමි~~

(signature)

නිලූකා ඒකනායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
20 16./.12./.12..........

**04.** තනතුරේ ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

**05.** වැටුප්

5.1 වැටුප් කේත අංකය : MN-3-2016

5.2 වැටුප් පරිමාණය : රු. රු. 31,040 – 10x445- 11x660-10x730-10x750-57550/-

5.3 ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| III | 01 | 31040/- |
| II | 12 | 36150/- |
| I | 23 | 43480/- |

* වැටුප් ගෙවීම් හා අනෙකුත් කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධාන අනුව විය යුතුය.

**06.** සේවා ගණයට අයත් තනතුරු :

6.1 අනුමත තනතුරු නාම,අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාමය | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| රසායනාගාර ශිල්පී | III, II, I | 02 | මධ්‍යම පළාත් සභාව යටතේ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු වලින් ක්‍රියාත්මක කරන ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ මධ්‍යම හා විශාල පරිමාණ ව්‍යාපෘතින්හි මූලික සමීක්ෂණ සඳහා අවශ්‍ය දත්ත සම්පාදනය කිරීම.<br><br>එම ක්ෂේත්‍රයේ ඉංජිනේරුමය ද්‍රව්‍ය සඳහා තත්ත්ව පරීක්ෂණ කටයුතු වල (පස්,යකඩ,වැලි, ගල් හා කොන්ක්‍රීට් ද්‍රව්‍යයන්හි ගතිගුණ හා ශක්තීන් පිළිබද) නිරත වීම.එම ද්‍රව්‍යයන්හි ප්‍රමිතීන් නිර්ණය කිරීමට අවශ්‍ය පරීක්ෂණ ඉටු කිරීමට ඉංජිනේරු වෙත සහාය වීම.<br>රජයේ හා පෞද්ගලික ආයතන වලින් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව වෙත ලැබෙන ඉල්ලීම් අනුව ඉහත පරිදි අවශ්‍ය පරීක්ෂණ කටයුතු වල නිරත වීම හා ඉංජිනේරු වෙත සහාය වීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 02කි. ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යයන් සඳහා III, II, සහ I ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ .

**07.** බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 50% |
| සීමිත | 50% |
| කුසලතා | අදාළ නොවේ. |

අනුමත කරමි / නොකරමි

..........................

නිලූකා ඒකනායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
20 .16../12/12.........

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් : සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව,විද්‍යාව,ගණිතය, සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය එකවර සමත්ව තිබීම.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර ( උසස් පෙළ) විභාගයේ ශුද්ධ, ගණිතය, ව්‍යවහාරික ගණිතය,සංයුක්ත ගණිතය,භෞතික විද්‍යාව,රසායන විද්‍යාව යන විෂයන්ගෙන් විෂයයන් දෙකක් සහිතව විද්‍යා /ගණිත විෂය ධාරාවන් යටතේ සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර ) එකවර සමත්ව තිබීම.පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03 කින් එකවර සමත්ව තිබීම.

7.2.2.2. වෘත්තීය සුදුසුකම් : තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තිරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තීය කුසලතා (N.V.Q) පහ (05) හෝ හය (06) මට්ටමේ කුසලතා සහතිකයක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබිය යුතුය.

I. මොරටුව විශ්ව විද්‍යාලයේ හෝ අම්පාරේ හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරිමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව

III අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව

හෝ

IV.ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරිම

හෝ

V. උසස් අධ්‍යාපන අමාත්‍යාංශ සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරනු ලබන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනුතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

7.2.2.3. පළපුරුද්ද : අදාළ නොවේ.

7.2.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයකුම මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරිමටත් තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.



අනුමත කරමි / නොකරමි

නිලුකා ඒකනායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
20 16 / 12 / 12

7.2.2.5 වෙනත් සුදුසුකම් : I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

III. අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කල යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට පූර්වාසන්නයෙන්ම වූ වසර 03ක කාලය තුළ මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3.වයස :

7.2.3.1 අවම සීමාව : අවුරුදු 18ට නොඅඩු

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 30ට නොවැඩි

(රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන සේවකයන් හට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත විභාගයක් පවත්වා ඉන් සමත් අයදුම්කරුවන් විසින් ලබාගත් ලකුණුවල ප්‍රමුඛතාවය අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන පිරිසක් බඳවා ගනු ලැබේ.ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොසිටී නම් පමණක් විවෘත පදනමින් බඳවා ගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය:

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය | විෂය නිර්දේශය |
|---|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 | ඇමුණුම 01 |
| තාක්ෂණ ප්‍රශ්ණ පත්‍රය | පැය 03 | 100 | 40 | |

7

7.2.4.1.1.පවත්වන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.2.4.2.වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.4.3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : (ලකුණු ලබාදෙනු නොලැබේ)

ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු : කායික යෝග්‍යතාව හා සුදුසුකම් පරීක්ෂා කිරීම

7.2.4.3.1. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා

:මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.2.4.4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ පුවත්පත්වල හෝ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින්

අනුමත කරමි / නොකරමි

නිලූකා ඒකනායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
20 18..12..12

**7.3 සීමිත බඳවා ගැනීම**

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.3.2. සුදුසුකම් :

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් : සිංහල / දෙමළ භාෂාව හෝ සාහිත්‍ය ,අංක ගණිතය, විද්‍යාව විෂයන්ට සම්මාන සාමාර්ථය සහිතව දෙවරකට නොවැඩි. වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් හයකින් (06) සමත්වී සිටීම

7.3.2.2.වෘත්තිය සුදුසුකම් : තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තිරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තිය කුසලතා (N.V.Q) පහ (05) හෝ හය (06) මට්ටමේ කුසලතා සහතිකයක් අදාළ ක්ෂේත්‍රයන් ලබා තිබිය යුතුය.

I. මොරටුව විශ්ව විද්‍යාලයේ හෝ අම්පාරේ හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

II.ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරිමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව

හෝ

III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව

IV ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම

හෝ

V උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත. සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරනු ලබන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

7.3.2.3 පළපුරුද්ද : ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ශ්‍රේණියක ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

7.3.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකු මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්,තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.

7.3.2.5 වෙනත් :

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

III. අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට පූර්වාසන්නයෙන්ම වූ වසර 03 ක කාලය තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

IV.තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.



අනුමත කරමි / නොකරමි

නිලූකා ඒකනායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාර
20 16 /12/ 12

7.3.3 වයස : අදාළ නොවේ.

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත විභාගයක් පවත්වා ඉන් සමත් අයදුම්කරුවන් විසින් ලබාගත් ලකුණුවල ප්‍රමුඛතාවය අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන පිරිසක් බඳවා ගනු ලැබේ.

7.3.4.1 ලිඛිත විභාගය

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය | විෂය නිර්දේශය |
|---|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 | ඇමුණුම 01 |
| තාක්ෂණ ප්‍රශ්ණ පත්‍රය | පැය 03 | 100 | 40 | |

7.3.4.1.1. පවත්වන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.3.4.2. වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.4.3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : (ලකුණු ලබාදෙනු නොලැබේ).

ඉටු කර ගැනිමට අපේක්ෂිත අරමුණු : කායික යෝග්‍යතාව හා සුදුසුකම් පරීක්ෂා කිරීම

7.3.4.3.1. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා

: මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.3.4.4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ පුවත්පත්වල හෝ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින්:

**08.** කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද? | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට පත්වී වසර තුනක් (03) ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය ඇමුණුම 02 |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර තුනක් (03) ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය ඇමුණුම 03 |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර පහක් (05) ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය ඇමුණුම 04 |

8.2 කාර්යක්ෂමතා කඩඉම් විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද :

වර්ෂයකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයා :

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

අනුමත කරමි / නොකරමි

නිලූකා ඒකනායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරිය
20 18/12/12

09. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධාරියෙකු විසින් පරිවාස කාලය තුළ එක් රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාව ලබා ගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |

**10.ශ්‍රේණි උසස් කිරීම**

10.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම

10.1.1.සපුරාලිය යුතු සුදුසුකම් :

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවාගණයේ III වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක(10) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස්වීමේ දිනට පූර්වාසන්නතම වසර දහය (10) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම.

VI. නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

10.1.2. උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් විසින් නියමිත ආකෘති පත්‍රය මගින් පත්වීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධාරියා විසින් සිදුකරනු ලැබේ.

අනුමත කරමි / නොකරමි

නිලූකා ඒකනායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
20 ../../..

10.2 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.

10.2.1 සපුරාලිය යුතු සුදුසුකම්:

I. සේවා ගණයේ II වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක (10) උපයාගෙන තිබීම.

II. උසස් වීමේ දිනට පූර්වාසන්නතම වසර පහක් (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

10.2.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන ලද සේවකයින් විසින් නියමිත ආකෘති පත්‍රය මගින් පත්වීම් බලධරයා වෙත ඉල්ලුම් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි තනතුරේ II ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධාරියා විසින් සිදුකරනු ලැබේ.

11. තනතුරුවලට පත්කිරීම : අදාළ නොවේ.

12. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම : අදාළ නොවේ.

13. අර්ථ නිරූපන හා නිර්වචනය

13.1 "බඳවා ගැනීමේ පරිපාටිය" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි රසායනාගාර ශිල්පී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියයි.

13.2 "ආණ්ඩුකාරතුමිය" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාතේ ගරු ආණ්ඩුකාරතුමා/තුමිය වේ.

13.3 "කොමිෂන් සභාව" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

13.4 "ප්‍රධාන ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා වේ.

13.5 "ලේකම්"යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වේ.

13.6 "අමාත්‍යාංශ ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ඉංජිනේරු සේවා විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයා වේ.

13.7 "දෙපාර්තමේන්තු ප්‍රධානියා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වේ.

13.8 "සතුටුදායක සේවා කාලය" යනුවෙන් අදහස් කරනුයේ, රජයේ නිලධරයකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරීම මගින්ද, සමත්විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම සමත්වීම මගින්ද සිදුකළ යුතුව තිබූ පත්වීම් ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද, එම කාලය තුළදී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ අඩුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේය.

13.9 "සක්‍රිය සේවා කාලය" යනුවෙන් අදහස් කරනුයේ රජයේ වුවමනාවන්ට හෝ/හා රජයේ ප්‍රතිපත්තිමය හේතු වලට යටත්ව ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් තමාට පැවරෙන රාජකාරියෙහි සත්‍ය වශයෙන්ම සේවය කරන ලද කාල සීමාව වේ.

අනුමත කරමි / නොකරමි
නිලූකා ඒකනායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
20 16/12/12

14. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි , මධ්‍යම පළාත් සභා මූල්‍ය රීති සහ රජය/ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන නීතිරීති හා/හෝ රෙගුලාසි අදාළ වේ.

15. මෙම බඳවාගැනීමේ පරිපාටියේ සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් හෝ පරිපාටියෙහි සලසා නොමැති යම් කරුණක් සම්බන්ධයෙන් පැන නගින ගැටලුවකදී මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගරු ආණ්ඩුකාරතුමියගෙන් විමසා ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය පරිදි තීරණය කරනු ලැබේ.

අනුමත කරමි / ~~නොකරමි~~

..............................
නිලූකා ඒකනායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
2016/12/12

ඇමුණුම - 01

<u>මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමණාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි රසායනාගාර ශිල්පි III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත /සීමිත තරග විභාගය</u>

01. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්ණ පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 2. තාක්ෂණ ප්‍රශ්ණ පත්‍රය | පැය 03 | 100 | 40 |

02. පවත්වනු ලබන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

03. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු පවතින අවස්ථා වලදී

04. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්,ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්,තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්ණ වලින් යුක්තය. |
| තාක්ෂණ ප්‍රශ්ණ පත්‍රය | වීජ ගණිතය,ජ්‍යාමිතිය,ත්‍රිකෝණමිතිය ආදී විෂයයන් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්ණ පත්‍රයකි.ද්‍රව සහ ද්‍රව්‍ය වල භෞතික ගුණ,ද්‍රවස්ථිති විද්‍යාව,මිණුම් ඒකක,පරිමාණ, සිතියම් කියවීම විද්‍යාත්මක ගණනය කිරීම ආදී විෂයයන් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්ණ පත්‍රයකි |

අනුමත කරමි / නොකරමි

.................................

නිලූකා ඒකනායක

මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර

20 16/12/12

<u>මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමණාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි රසායනාගාර ශිල්පි III ශ්‍රේණියේ නිලධාරීන් සදහා වන කාර්යක්ෂමතා කඩඉම</u>

01. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්ණ පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1.කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | පැය 01 | 100 | 40 |
| 2. මුදල් රෙගුලාසි | පැය 03 | 100 | 40 |

02.පවත්වනු ලබන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

03.විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වර්ෂයකට දෙවරක්

04. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | මෙම ප්‍රශ්ණ පත්‍රය ආයතන සංග්‍රහයේ පහත සදහන් පරිච්ඡේද මත සැකසේ.<br><br>II වන පරිච්ඡේදය - සේවයට බදවා ගැනීමේ ක්‍රියා පරිපාටිය හා පත් කිරීම<br>III වන පරිච්ඡේදය - මාරු කිරීම<br>IV වනපරිච්ඡේදය - මාස් පඩි,තාවකාලික තත්ත්වය,ස්ථිර තත්ත්වය සහ විශ්‍රාම වැටුප් හිමිකම ප්‍රදානය කිරීම<br>V වන පරිච්ඡේදය - මුදා හැරීම ,කලින් දැරූ තනතුරට පෙරළා ගැනීම හා සේවය අවසන් කිරීම<br>VIII වන පරිච්ඡේදය- අතිකාල දීමනා නිවාඩු දවස් හා නිවාඩු දවස් සඳහා වැටුප් දීමනා හා<br>XII වන පරිච්ඡේදය - නිවාඩු<br>XIII වන පරිච්ඡේදය - දුම්රිය බලපත්‍ර<br>XIV වන පරිච්ඡේදය - දිවයින ඇතුලත රාජකාරි ගමන්<br>XIX වන පරිච්ඡේදය - රජයේ නිවාස<br>XLVIII වන පරිච්ඡේදය - සාමාන්‍ය හැසිරීම හා විනය |
| මුදල් රෙගුලාසි | මෙම ප්‍රශ්ණ පත්‍රය මුදල් රෙගුලාසි වල පහත සදහන් පරිච්ඡේද මත සැකසේ.<br>(1) <u>Iවන පරිච්ඡේදය</u><br>වියදම් හා ආදායම් ඇස්තමේන්තුව<br>ඒකාබද්ධ අරමුදල වාර්ෂික ඇස්තමේන්තු වාර්ෂික ඇස්තමේන්තු , වෙනස්කිරීම<br>(මු.රෙ. 1 සිට 68 දක්වා)<br>(2) <u>IIIවන පරිච්ඡේදය</u><br>මූල්‍ය කළමනාකරණය හා අන්තරදායී බව<br>ප්‍රධාන ගණක නිලධාරීන් ගණක නිලධාරීන්, ආදායම් ගිණුම් නිලධාරීන් ගෙවීම් සඳහා බලය ලබා දීම, අනුමත කිරීම ,සහතික කිරීම හා කාර්ය පැවරීම.<br>(මු.රෙ. 124 සිට 147 දක්වා) |



අනුමත කරමි / නොකරමි

නිලූකා ඒකනායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
20 16.12.12

**මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමණාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි රසායනාගාර ශිල්පි II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම**

01. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්ණ පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1.කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | පැය 02 | 100 | 40 |
| 2. මුදල් රෙගුලාසි | පැය 03 | 100 | 40 |

02. පවත්වනු ලබන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

03. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වර්ෂයකට දෙවරක්

04. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | මෙම ප්‍රශ්ණ පත්‍රය ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.<br>XV වන පරිච්ඡේදය - අධ්‍යාපන අභ්‍යාස හෝ රාජකාරි කටයුතු සඳහා පිටරට යාම<br>XVI වන පරිච්ඡේදය - නිවාඩු ගමන්<br>XXIII වන පරිච්ඡේදය - ඇතැම් වර්ග වල ලෙඩ රෝග වලින් පෙලෙන රජයේ නිලධාරීන්ට විශේෂ අනුග්‍රහ සහ ඒ පිළිබඳ කොන්දේසි<br>XXIV වන පරිච්ඡේදය - වැටුප් ණය සහ අත්තිකාරම්<br>XXV වන පරිච්ඡේදය - වෘත්තිය සංගම්වල සාමාජිකයින්ට අනුග්‍රහය<br>XXVII වන පරිච්ඡේදය - ලිපි ගනුදෙනු කිරීමේ මාර්ගය<br>XXVIII වන පරිච්ඡේදය - පරිපාලන කාර්ය පරිපාටි හා විධි<br>XXX වන පරිච්ඡේදය - රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල<br>XXXIII වන පරිච්ඡේදය - නීති උපදෙස් හා නීති ක්‍රියාමාර්ග<br>XLVII වන පරිච්ඡේදය - සාමාන්‍ය හැසිරීම හා විනය<br>XLVIII වන පරිච්ඡේදය - විනය කාර්ය පරිපාටි<br>නිලධාරීන්ගේ කාර්ය සාධන ඇගයීම් පිළිබද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අදාළ වේ. |
| මුදල් රෙගුලාසි | මෙම ප්‍රශ්ණ පත්‍රය මුදල් රෙගුලාසි වල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.<br>VI වන පරිච්ඡේදය<br>ආණ්ඩුවේ මුදල් යනාදිය භාරකාරීත්වය, අග්‍රිමය හා බැංකු ගිණුම් රාජ්‍ය මූල්‍ය සුරක්ෂිතභාවය සමීක්ෂණ මණ්ඩලය,අයිරාව,බැංකු ගිණුම්<br>(මු.රෙ 315 සිට 396 දක්වා)<br>XIII වන පරිච්ඡේදය<br>සැපයුම් වැඩ හා සේවා<br>සැපයීම්/ මිලට ගැනීමේ ක්‍රියාවලිය, ,ගබඩා සමීක්ෂණ,ගබඩාකරණය ක්‍රියාවලිය. කොන්ත්‍රාත්, ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරවීම.<br>(මු.රෙ.708 සිට 775) |

අනුමත කරමි / නොකරමි

නිලූකා ඒකනායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
20 16/12/12

**<u>මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමණාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි රසායනාගාර ශිල්පි 1 ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම</u>**

01. සම්මුඛ පරීක්ෂණය පිළිබඳ විස්තර :

| පරීක්ෂණ අංග | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | පැය 1 1/2 | 100 | 40 |
| කළමනාකරණය | පැය 1 1/2 | 100 | 40 |

02.පවත්වනු ලබන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

03.විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු පවතින අවස්ථාවලදී

04. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | නඩත්තු හා මෙහෙයුම් පිළිබඳ දෙපාර්තමේන්තු චක්‍රලේඛ ස්ථාවර නියෝග හා සාමාන්‍ය නඩත්තු පරීක්ෂා කිරීම.<br>සැලසුම් නිර්මාණය පිළිබඳ වැඩ සැලසුම් පරීක්ෂාවන් කිරීමේ න්‍යාෂ්ටික ක්‍රම<br>සංඛ්‍යා ලේඛණ විශ්ලේෂණය<br>පෙරහන් හා පාෂාණ පිරිවැත පිළිබඳ සිද්ධාන්ත<br>කොන්ක්‍රිට් වල වායු අන්තර්ග්‍රහණය කොන්ක්‍රිට් මිශ්‍රණ සැලසුම්<br>පී.එච්. අගය |
| කළමනාකරණය | 1.කළමනාකරණ මූලධර්ම<br>2.කළමනාකරණ ශ්‍රිතයන්<br>සැලසුම් කිරීම<br>තීරණ ගැනීම<br>තීරණ ගැනීමේ ක්‍රියාවලිය<br>සංවිධානය<br>මාණ්ඩලිකරණය<br>මෙහෙයවීම<br>අභිප්‍රේරණය ක්‍රියාවලිය<br>නායකත්වය<br>පාලනය<br>පාලනමය ප්‍රතිපත්ති ක්‍රියාවලිය<br>3.සහභාගිත්ව කළමනාකරණය<br>4.කළමනාකරණ පරිසරය<br>5.සිද්ධි අධ්‍යයනය |

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :- නිර්දේශ කරමු

| | | |
|---|---|---|
| 01.ගාමිණී දසනායක මහතා | (සභාපති) | ........................ |
| 02. යූ.ඒ.බෝගහපිටිය මහතා | (සාමාජික) | ........................ |
| 03.ජී.ජී.එස්.ඒ.දිසානායක මිය | (සාමාජික) | ........................ |
| 04.වෛත්‍යලිංගම් නන්දකුමාර් මහතා | (සාමාජික) | ........................ |
| 05.ඒ.ජේ.එම්.මොහිදීන් නිස්තාර් මහතා | (සාමාජික) | A.J.M.M. ........................ |

දිනය 2016.10.25

ආණ්ඩුකාර ලේකම්,

2016.10.25 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 16/1569 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි රසායනාගාර ශිල්පී තනතුර සදහා වන බදවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය සදහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2016.11.30

........................

ලේකම්
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
ආර්. එම්. එන්. රත්නායක
නිල මුද්‍රාව ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය :- අනුමත කරමි/නොකරමි.

අනුමත කරමි / නොකරමි

........................
නිලූකා ඒකනායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
20 16/12/12